# කාර්යසාධන හා වාර්ෂික ගිණුම් වාර්තාව -2012

# செயற்திறன் அறிக்கை மற்றும் ஆண்டுக் கணக்குகள் -2012

# Performance Report and Annual Accounts - 2012



**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කිලිනොච්චිය**

**மாவட்டச் செயலகம் - கிளிநொச்சி**

**District Secretariat - Kilinochchi**

# කාර්යසාධන වාර්තාව

# 2012

# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කිළිනොච්චිය

# <u>කාර්යසාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම් - 2012</u>

# <u>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කිළිනොච්චිය</u>

පටුන


| කාර්යසාධන වාර්තාව - 2012 | පිටුව |
|---|---|
| **1.** දිස්ත්‍රික් ලේකම්තුමියගේ පණිවුඩය | **01** |
| **2.** දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හැදින්වීම | |
| **2.1.** දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දැක්ම සහ මෙහෙවර | **02** |
| **2.2.** දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අරමුණු හා කාර්යභාරය | **03** |
| **3.** දිස්ත්‍රික්කයේ හැදින්වීම | **05** |
| **3.1** දිස්ත්‍රික්කයේ පරිපාලන සිතියම | **06** |
| **3.2** දිස්ත්‍රික්කයේ මූලික සංඛ්‍යා ලේඛණ තොරතුරු | **07** |
| 4. ආයතන ව්‍යුහය සහ අනුමත කාර්ය මණ්ඩලය | |
| **4.1** සංවිධාන සිතියම | **08** |
| **4.2** අනුමත කාර්ය මණ්ඩලය | **09** |
| **5.** කාර්ය සාධනය | |
| **5.1** රාජ්‍ය පරිපාලන කටයුතු | **11** |
| **5.2** සමාජ සහ සංස්කෘතික කටයුතු | **21** |
| **5.3** සංවර්ධන කටයුතු | 32 |
| **5.3.1.**රේඛීය අමාත්‍යාංශ සහ අනෙක් දෙපාර්තමේන්තු යටතේ ගෙවීම් සම්බන්ධ තොරතුරු | 44 |
| **5.4** ගිණුම් සාරාංශ වාර්තාව | **46** |

## 1.දිසාපතිතුමියගේ පණිවුඩය

කිළිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2012 වසර සඳහා කාර්ය සාධනය සහ ගිණුම් වාර්තාව ඉදිරිපත් කිරීමේදී ඉමහත් සතුටට පත්වෙමි. මෙම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, එහි ප්‍රාදේශීය ලේකම් කාර්යාල හතර සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන අනෙක් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල උප කාර්යාල ආදියේ කාර්ය සාධනය මෙම 2012 වසර වාර්තාවෙන් ඉදිරිපත් කර ඇත.

2012 වසරේ තක්සේරුව මගින් භාණ්ඩාගාරය විසින් කිළිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට වෙන්කරන ලද ප්‍රතිපාදන අරපරිස්සමෙන් සහ ඵලදායී ලෙස වැය කර ඇත. මෙමඟින් ජනතාව සඳහා පොදු සේවා කටයුතු සහ සංවර්ධන කටයුතු කඩිනම් කර ඇත. ඒ සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සමග ඒකාබද්ධව සියළු සේවා සපයන ශාඛාවන් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පූර්ණ කැපවීමෙන් කටයුතු කර ඇත.

ආර්ථික සංවර්ධන අමාත්‍යාශයේ ප්‍රතිපාදන වෙන්කිරීම මගින් මහින්ද චින්තන යටතේ දිවිනැගුම සැලැස්ම ප්‍රශස්ත අයුරින් දියත් කර ඇත. රේඛීය අමාත්‍යාංශ මගින් ලබාදුන් ප්‍රතිපාදන යටතේ පහත සඳහන් වැඩසටහන් ඵලදායී ලෙස ඉටු කර තිබීම තවත් වාර්තාවකි.

අවසාන වශයෙන් මෙම දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජීවනාධාර අවශ්‍යතාවයන් සහ සංවර්ධන සේවාවන් ගුණාත්මක බවින්ද ඵලදායී ලෙසද සිදුකිරීමට විවිධාකාරයෙන් සහයෝගය සහ උපදෙස් ලබාදුන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ අනෙක් දෙපාර්තමේන්තුවලට මාගේ ස්තුතිය පිරිනමමි.

# 2.දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හැඳින්වීම

## 2.1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දැක්ම සහ මෙහෙවර

**දැක්ම**

**සතුට ඔබගේ දොරටුව අභියසට ගෙන ඒම. එයයි අපේ ඉලක්කය.**

**සේවා අරමුණ**

**"කැපවීමකින් සේවය කිරීමට කැමති, සංවේගවත් සැලකිලිවලින් පෙළඹුනු සේවකයන්ගේ සේවාවන් තුලින් සතුට ඔබගේ දොරකඩ වෙත ගෙන ඒම" අපගේ අරමුණ වේ.**

## 2.2 . දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අරමුණු හා කාර්යභාරය

- ➢ කාර්යක්ෂමතාවය සඳහා දිස්ත්‍රික් පරිපාලන ක්‍රමය
- දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිපාලන කටයුතු සිදු කිරිම.
- සේවකයින් සම්බන්ධව සියලු කටයුතු සිදු කිරිම.
  (පුද්ගලික ලිපිගොනු, නිවාඩු, වැටුප්, අතිකාල දීමනා, නිවාඩු දින දීමනා, සේවක ගමන් බලපත්‍ර, ණය සහන .......... යනාදිය)

- ➢ පොදු ජනතාව සඳහා සේවය ලබා දීම හෝ එකී සේවා අදාල ආයතන වලින් ලබාගැනීම සඳහා සම්බන්ධීකරණය කිරීම.
- ගමන් බලපත්‍ර, හැඳුනුම්පත් ලබා දීම, මෝටර් රථ වාහන බද්ද, ව්‍යාපාර අවසර පත්‍රය, උප්පැන්න, මරණ සහ විවාහ සහතික
- මාර්ග ප්‍රවාහන බලපත්‍ර ලබාදීම.
- රියදුරු බලපත්‍ර ලබාදීම.
- ඡන්දහිමියන් ලියාපදිංචි කිරීම.
- ඉඩම් ඔප්පු සහ බලපත්‍ර ලබාදීම විධිමත් කිරිම සහ ඉඩම් ගැටළු විසඳීම.
- වැඩිහිටි සහ ආබාධිත අය සඳහා මාසික සහනාධාරය
- මහජනතාව සඳහා මානසික සෞඛ්‍ය තත්ත්වය/යහපත් මානසික තත්ත්වයන් නංවාලීම සඳහා කටයුතු කිරිම.
- රැකියා විරහිත තරුණ තරුණියන් සඳහා රැකියා පුහුණු සහ කාන්තා නායකත්ව පවුල් සඳහා ස්වයං රැකියා පුහුණුව හා දිරිගැන්වීම.

- ➢ සමස්ථ පරමාර්ථයන් ළඟාකර ගැනීම පිණිස යහපත්/ස්ථාවර මූල්‍ය ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යෑම.

- වාර්ෂික ප්‍රතිපාදන නිසි අධිකාරී බලයකින් හා ගිණුම් තැබීමක් සමඟ කාර්යක්ෂමව යොදා ගැනීම
- සේවකයන් සඳහා අදාල දීමනා ලබාදීම
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තැන්පතු ගිණුම්වල ඇති මුදල් ප්‍රමාණවත් පාලනයකින් යුක්තව භාවිතා කිරීම
- මාසික, වාර්ෂික වාර්තා නියමිත පරිදි අදාල දෙපාර්තමේන්තුවලට ඉදිරිපත් කිරීම
- විශ්‍රාම වැටුප් ගෙවීම
- දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් ලබා ගනු ලබන සේවා සඳහා දීමනා
- වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම හා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම

- ➢ දිස්ත්‍රික් කලා සංස්කෘතික කටයුතු නගාසිටුවීමට හා කලඑළි දැක්වීම සඳහා අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම
- දිස්ත්‍රික් කලා උත්සව හා ක්‍රීඩා උත්සව පැවැත්වීම

- ➢ දිස්ත්‍රික්කයේ තිබෙන සම්පත් කාර්යක්ෂම ලෙස භාවිතා කිරිම සහ ඒ සඳහා සැලසුම් සකස් කිරිම.
  මෙම සියළු කාර්යයන් සැලසුම් අංශය, ඉඩම් භාවිතය හා සැලසුම් අංශය ,දිස්ත්‍රික් කර්මාන්ත සංවර්ධන ඒකකය හා දිස්ත්‍රික් කෘෂිකර්ම ඒකකය මඟින් ක්‍රියාත්මක කෙරේ.
- ➢ පොදු ජනතාව ආපදා වලින් ආරක්ෂා කිරිම.

- රාජ්‍ය නොවන සංවිධාන සමග එක්ව දිස්ත්‍රික්කයේ ඇතිවන ආපදා වලදී (ගංවතුර, සුළිසුළං, අධික වර්ෂාව, ඉඩෝරය) ඊට මුහුණපාන ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරාලමින් ජනතාව ආරක්ෂා කිරීම.

➢ දිස්ත්‍රික්කයේ සියළු මූලික සංඛ්‍යා ලේඛන තොරතුරු එක්රැස් කිරීම සහ පවත්වාගෙන යෑම සංඛ්‍යා ලේඛන අංශය විසින් සිදු කරයි.

➢ දිස්ත්‍රික් ප්‍රාදේශීය හා ග්‍රාම සංවර්ධන කටයුතු ශක්තිමත් කිරීම සඳහා සැලසුම් සකස් කිරිම හා සම්බන්ධීකරණය කිරීම.

- මාර්ග සංවර්ධනය, වාරිමාර්ග හා විදුලි පහසුකම්
- විමද්‍යාගත අයවැය මගින් දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සඳහා ලැබෙන මුදල් කාර්යක්ෂමව භාවිතාකිරීම හා අධීක්ෂණය කිරීම.
- රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරිම හා අධික්ෂණය කිරිම. (දිවි නැගුම, ගම නැගුම, මග නැගුම)
- නිවාස සැලසුම් ව්‍යාපෘති සඳහා සහාය දැක්වීම.
- යුද්ධයෙන් පීඩාවට පත්වුවන් සඳහා වන්දි ලබාදීම.

## 3.දිස්ත්‍රික්කයේ හැඳින්වීම

යාපනය දිස්ත්‍රික්කය සමග ඒකාබද්ධව තිබූ කිළිනොච්චිය ප්‍රාදේශීය නව දිස්ත්‍රික්කයක් ලෙස **1984** වසරේ පෙබරවාරි මස **04** දින පිහිටුවන ලදී. එහි මායිම්

| | | |
|---|---|---|
| උතුරට | - | යාපනය දිස්ත්‍රික්කය |
| නැගෙනහිරට හා දකුණට | - | මුලතිව් දිස්ත්‍රික්කය |
| බටහිරට සහ දකුණට | - | මන්නාරම දිස්ත්‍රික්කය |

ඓතිහාසික වැදගත් ස්ථාන ලෙස උරුත්තිරපුරම් ශිවන් කෝවිල, පුළියම්පොක්කනෛ නාගතම්බිරාන් කෝවිල, මන්නිත්තලෛ සෙන්ට් ඇන්තනීස් පල්ලිය, පාලෛතිවු ශුද්ධ අන්තෝනි පල්ලිය, පොන්නාවෙලි ශිවන් කෝවිල, පූනගරි ඕලන්ද කොටුව ආදිය සැලකේ.

ස්වාභාවික සම්පත් වන ඉරණමඩු වැව, සුණ්ඩිකුලම් පක්ෂි උද්‍යානය, කෞදාරිමුනෛ මුහුදු වෙරළ ආදිය මෙහි පිහිටා ඇත.

මෙම දිස්ත්‍රික්කයේ ප්‍රාධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තය වේ. බොහෝදෙනෙක් වී ගොවිතැනෙහි නිරතව සිටින අතර අනෙක් පිරිස් ධීවර කර්මාන්තයේ යෙදේ. අනෙක් පිරිස වෙනත් ආහාර භෝග නිෂ්පාදනය, පලතුරු වගාව, ගව, එළු, කුකුල් පාලනය ආදී රැකියාවල නිරතව සිටිති. ඉරණමඩු වැව ඇතුළු විශාල වැව් අටක් සහ කුඩා වැව් **312** ක් මෙම දිස්ත්‍රික්කයේ පිහිටා ඇත. ඒ සමඟ වැසි ජලය වගාවන්ට බොහෝ සේ උපකාරී වේ.
මෙම දිස්ත්‍රික්කයේ ජනතාව සම්පූර්ණයෙන්ම මෑතකාලීන යුද්ධයෙන් අවතැන් වී සිට **2009** වසරේ දෙසැම්බර් මස සිට නැවත පදිංචි වූහ. **2012.12.31** දිනට සිටින ජනගහණ සංඛ්‍යා ලේඛන පහත දැක්වේ.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | පිරිමි | කාන්තා | මුළු ජනගහණය |
|---|---|---|---|
| කෙරෙච්චි | **33506** | **36202** | **69708** |
| කණ්ඩාවෙලෙ | **11639** | **12596** | **24235** |
| පූනගරි | **11567** | **11951** | **23518** |
| පච්චිලෛප්පල්ලි | **5611** | **5898** | **11509** |
| එකතුව | **62323** | **66647** | **128970** |

මෙම දිස්ත්‍රික්කයේ සාමාන්‍ය වර්ෂාපතනය මිලිමීටර් **1520.57** ක් පමණ වේ. වර්ෂාපතනයෙන් 75% ක් සැප්තැම්බර් මස සිට දෙසැම්බර් මස දක්වා උතුරු නැගෙනහිර මෝසම් සුළං මගින් ලැබේ. උණුසුම් කාලය ලෙස ජූනි සිට අගෝස්තු මාසය දක්වා සැලකේ. මාසිකව සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක **25** සිට **30** දක්වා වේ.

## 3.1.දිස්ත්‍රික් පරිපාලන සිතියම



## 3.2.දිස්ත්‍රික් මූලික සංඛ්‍යා ලේඛන තොරතුරු

| | |
|---|---|
| දිස්ත්‍රික්කයේ නම | කිළිනොච්චිය |
| පළාත | උතුරු පළාත |
| මුළු භූමි ප්‍රමාණය | වර්ග.කි.මී1237.11 |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 04 |
| ග්‍රාම නිළධාරී කොට්ඨාශ සංඛ්‍යාව | 95 |
| ගම් සංඛ්‍යාව | 354 |
| ඡන්ද කොට්ඨාශ සංඛ්‍යාව | 95 |
| මහ නගර සභා සංඛ්‍යාව | -- |
| නගර සභා සංඛ්‍යාව | -- |
| ප්‍රාදේශීය සභා සංඛ්‍යාව | 03 |
| අමාත්‍යාංශයේ දිස්ත්‍රික් ලේකම් යටතේ පවතින රජයේ නිල නිවස | 01 |
| කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්ගේ සංඛ්‍යාව | 01 |
| පාසල් සංඛ්‍යාව සහ ගුරුවරුන්ගේ සංඛ්‍යාව | 108/1702 |
| පාර්ලිමේන්තු නියෝජිත සංඛ්‍යාව | 09 |
| පළාත් සභා නියෝජිත සංඛ්‍යාව | -- |
| පළාත් පාලන ආයතන නියෝජිත සංඛ්‍යාව | 37 |
| ජනගහණය | 128970 |

## 4. ආයතන ව්‍යුහය සහ අනුමත කාර්ය මණ්ඩල තොරතුරු

## 4.1 සංවිධාන සිතියම



## 4.2. අනුමත කාර්ය මණ්ඩල තොරතුරු

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ( ව්‍යාපෘති-1 )**

| අනු අං ක-ය | තනතුර | සේවය | ශ්‍රේණිය/ පන්තිය | අනුමත කාර්ය මණ්ඩලය | වත්මන් කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|
| | **ජ්‍යේෂ්ඨ මට්ටම (අ)** | | | | | |
| **1** | දිස්ත්‍රික් ලේකම් | ශ්‍රී. ලං. ප. සේ | විශේෂ | **1** | වැඩබලන ශ්‍රිලංකා.ප.සේ -1 | **0** |
| **2** | අතිරේක දිස්ත්‍රික් ලේකම් | ශ්‍රී. ලං. ප. සේ | **I** | **1** | **1** | **0** |
| **3** | සහකාර දිස්ත්‍රික් ලේකම් | ශ්‍රී. ලං. ප. සේ | **III** | **1** | **1** | **0** |
| **4** | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී. ලං. ග. සේ | **I** | **1** | **1** | **0** |
| **5** | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී. ලං. ග. සේ | **I** | **1** | **-** | **1** |
| **6** | ගණකාධිකාරී | ශ්‍රී. ලං .ග . සේ | **III** | **1** | **1** | **-** |
| **7** | ඉංජිනේරු | ශ්‍රී. ලං. ඉ. සේ | **III** | **1** | **1** | **0** |
| | **3 වැනි මට්ටම (ආ)** | | | | | |
| **8** | පරිපාලන නිළධාරී | අධි ශ්‍රේණිය | අධි ශ්‍රේණිය | **1** | **1** | **0** |
| **9** | භාෂා පරිවර්තක | පරිවර්තක සේවය | **I** | **1** | **0** | **1** |
| | **2 වැනි මට්ටම(ඇ)** | | | | | |
| **10** | සංවර්ධන සම්බන්ධීකාරක | උපාධිධාරී | | **2** | **-** | **2** |
| **11** | අය වැය සහකාර | උපාධිධාරී | | **2** | **-** | **2** |
| **12** | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා. ක . ස. සේ | **I,II,III** | **56** | **56** | **0** |
| **13** | කාර්මික නිළධාරී | ශ්‍රී. ලං. තා. සේ | **II**ආ | **1** | **-** | **1** |
| **14** | ඩ්‍රාෆ්ට්මන් | ශ්‍රී. ලං. තා. සේ | **II**ආ | **1** | **-** | **1** |
| **15** | පිළිගැනීමේ නිළධාරී | | | **1** | **1** | **0** |
| | **1වැනි මට්ටම(ඇ)** | | | | | |
| **16** | රියදුරු | රියදුරු සේවය | **II**ආ**,II**අ**,I** | **4** | **4** | **0** |
| **17** | කාර්යාල කාර්ය සහායක | කා. කා.සේ | **I,II,III** | **30** | **21** | **9** |
| **18** | මුරකරු | | | **2** | **2** | **0** |
| | එකතුව | | | **108** | **91** | **17** |

## ප්‍රාදේශීය ලේකම් කාර්යාල (ව්‍යාපෘති-2)

| අනු අංක -ය | තනතුර | සේවය | ශ්‍රේණිය/ පන්තිය | අනුමත කාර්ය මණ්ඩලය | වත්මන් කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|
| | ජ්‍යේෂ්ඨ මට්ටම (අ) | | | | | |
| 01 | ප්‍රාදේශීය ලේකම් | ශ්‍රී. ලං. ප. සේ | I | 4 | 4 වැඩබලන ශ්‍රීලංකා.ප.සේ III | 0 |
| 02 | සහකාර ප්‍රාදේශීය ලේකම් | ශ්‍රී.ලං.ප.සේ | III | 4 | 0 | 4 |
| 03 | ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ | III | 4 | 1 | 3 |
| | 3 වැනි මට්ටම(ආ) | | | | | |
| 04 | පරිපාලන නිළධාරී | රා.ක .ස.සේ | අධි ශ්‍රේණිය | 4 | 1 | 3 |
| 05 | පරිපාලන ග්‍රාම නිළධාරී | ග්‍රා.නි.සේ | අධි ශ්‍රේණිය | 4 | 0 | 4 |
| 06 | භාෂා පරිවර්තක | ප.සේ | | 4 | 0 | 4 |
| | 3වැනි මට්ටම(ඇ) | | | | | |
| 07 | අයවැය සහකාර | උපාධිධාරි | | 4 | 0 | 4 |
| 08 | සංවර්ධන සම්බන්ධීකාරක | උපාධිධාරි | | 4 | 0 | 4 |
| 09 | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.ක.ස.සේ | I,II,III | 150 | 52 | 98 |
| 10 | ග්‍රාම නිළධාරී | ග්‍රා.නි.සේ. | I,II,III | 95 | 55 | 40 |
| 11 | කාර්මික නිළධාරී | ශ්‍රී.ලං.තා.සේ | | 4 | 0 | 4 |
| 12 | ඩ්රාෆ්ට්මන් | ශ්‍රී.ලං.තා.සේ | | 4 | 0 | 4 |
| | 1වැනි මට්ටම(ඇ) | | | | | |
| 13 | ලේඛණ භාරකරු | කා.කා. සේ | | 4 | 0 | 4 |
| 14 | රියදුරු | රියදුරු සේවය | IIඅ, IIආ, I | 12 | 9 | 3 |
| 15 | දුරකතන ක්‍රියාකරු | කා.කා. සේ | I | 4 | 0 | 4 |
| 16 | මුරකරු | කා.කා. සේ | II | 12 | 3 | 9 |
| 17 | කාර්යාල කාර්ය සහායක | කා.කා. සේ | III | 33 | 19 | 14 |
| 18 | සනීපාරක්ෂක කම්කරු | කා.කා. සේ | II | 4 | 2 | 2 |
| 19 | උද්‍යාන කම්කරු | කා.කා.සේ | II | 4 | 0 | 4 |
| 20 | පොත් බඳින්නා | කා.කා. සේ | I | 4 | 1 | 3 |
| | එකතුව | | | 362 | 147 | 215 |

## 05. කාර්ය සාධනය

### 5 .1. රාජ්‍ය පරිපාලන කටයුතු

### (අ) ග්‍රාම නිලධාරීන්

ග්‍රාම නිලධාරී කොට්ඨාශ 95 ඇතුලත්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හතරකින් යුත් මෙම දිස්ත්‍රික්කයේ 2012 වසරේ ග්‍රාම නිලධාරීන් සඳහා කළමනාකරණ තරගයෙන් කරච්චි කොට්ඨාශයට අයත් වට්ටක්කච්චි ග්‍රාම නිලධාරී කොට්ඨාශය ප්‍රථම ස්ථානය ලබා ඇත.

### (ආ) අභ්‍යන්තර විගණනය

දිස්ත්‍රික් ලේකම්තුමියගේ අධීක්ෂණය යටතේ කළමනාකරණ සහකාර නිලධාරියෙකු ,විගණන නිලධාරියෙක් ලෙස පත් කර අභ්‍යන්තර විගණන කටයුතු සිදු කෙරේ. මෙම අභ්‍යන්තර විගණන නිලධාරියා විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, දිස්ත්‍රික් සැලසුම් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හතරෙහි අභ්‍යන්තර විගණන කටයුතු සිදුකර ඒවාගේ දක්නට ලැබෙන අඩුපාඩු සකස් කර ඇත. ඒ අතර මාස තුනකට වරක් අභ්‍යන්තර විගණන කමිටු රැස්වීම් වාර්තාව සකස් කර රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයට යවනු ලැබේ. රාජ්‍ය පරිපාලන කටයුතු අමාත්‍යාංශය විසින් අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා උපාධිධාරී අභ්‍යාසලාභීන් පස් දෙනෙකුගෙන් සමන්විත වෙනම අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපනය කර ඇත. ඒ සමඟ අභ්‍යන්තර විගණන කටයුතු සඳහා පළමු පන්තියේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයකු 2012 නව කාර්ය මණ්ඩලයෙන් ඇති කර ඇති නමුත් එම තනතුර පුරප්පාඩුව පවතී.

### (ඉ) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

<u>රියදුරු බලපත්‍ර</u>

| | |
|---|---|
| භාරගත් අයදුම්පත් | 4814 |
| ලිඛිත පරික්ෂණයෙන් සමත් සංඛ්‍යාව | 4277 |
| ප්‍රායෝගික පරික්ෂණයට පැමිණ සිටි සංඛ්‍යාව | 3992 |
| ප්‍රායෝගික පරික්ෂණයෙන් සමත් සංඛ්‍යාව | |
| යතුරුපැදි | 3972 |
| ත්‍රීරෝද රථ | 3480 |
| වෑන් රථ | 2360 |
| ට්‍රැක්ටර් | 592 |
| බස් | 3 |

<u>වාහන අයිතීන් වෙනස් කිරීම</u>

භාරගත් අයදුම්පත් 664

**(ඊ) පුහුණු පන්ති**

රාජ්‍ය පරිපාලන කටයුතු අමාත්‍යාංශය යටතේ රාජ්‍ය සේවා පුහුණු ආයතනයේ අනුග්‍රහයෙන් කිළිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පවත්වන ලද පුහුණු.

- කළමනාකරණ සහකාරවරුන්ට පහත විෂයයන් යටතේ පුහුණු පාඨමාලා ලබා දෙන ලදී. කාර්යාලය, ගබඩාකරණය, මුදල් කළමනාකරණය, විශ්‍රාම වැටුප්, සිගාස්, යහපාලනය සහ මානව සම්පත් කළමනාකරණය.
- කාර්යාල සේවකයින් සහ රියදුරන් සඳහා පුහුණු පාඨමාලා

**(උ) ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා**

01. ජාතික භාෂාවන් සම්බන්ධ කටයුතු

- මානව හිමිකම් කොමිසම සමඟ ඒකාබද්ධව භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධ අවශ්‍යතා සොයා බලන ලදී.
- ත්‍රෛභාෂා ශබ්ද කෝෂය සහ භාෂා පරිවර්තන සංචිතය සම්බන්ධයෙන් සියළු දිස්ත්‍රික්ක, දෙපාර්තමේන්තු දැනුවත් කරන ලදී.
- පොදු ප්‍රවාහනයේ නිරතව තිබෙන බස් වල ත්‍රෛභාෂා ක්‍රියාත්මක කිරීම සම්බන්ධ පරීක්ෂණ. පොලිස් දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ කරන ලදී.
- දෙපාර්තමේන්තු වල ත්‍රෛභාෂා භාවිතය සම්බන්ධව පරික්ෂණ සිදු කරන ලදි.
- ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයේ පළාත් කාර්යාල සඳහා නාම පුවරු සකස් කරන ලදී.
- රාජ්‍ය නිලධාරීන්ගේ වාහන වල භාවිතා කරන නම් සහ තනතුරු භාෂා තුනෙන්ම භාවිතා කිරීම පිළිබඳ දැනුවත් කරන ලදී.

02. භාෂා සංගම් ක්‍රියාත්මක කිරීමේ කටයුතු

- කණ්ඩාවලෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සංගම් 41 ක් පිහිටුවා, 20 ක් ලියාපදිංචි කරන ලදී.
- පච්චිලෙප්පල්ලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ භාෂා සංගම් 16 ක් පහිටුවන ලදී.

03. නිලධාරීන් සඳහා භාෂා පුහුණු පන්ති

- සිංහල මට්ටම **III** පන්ති, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පැවැත්වෙන අතර නිලධාරීන් 41 දෙනෙකු එයට සහභාගී වේ.

- සිංහල මට්ටම II පන්ති, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පැවැත්වෙන අතර නිලධාරීන් 42 දෙනෙකු එයට සහභාගී වේ.

04.සමාජ ඒකාබද්ධතා වැඩසටහන්

- මාර්තු සමාජ ඒකාබද්ධතා ගැටළු පිළිබඳ සාකච්ඡාව - 2012 මාර්තු 11 වන දින කිලිනොච්චිය මධ්‍ය විද්‍යාලයේදී පැවැත්විණි. ඒ සඳහා 640 කට අධික ජනගහනයක් සහභාගී විය.
- සමාජ ඒකාබද්ධතා තොරතුරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හතරටම එකතු කරන ලදී.
- සමාජ ඒකාබද්ධතා සංවර්ධන වැඩසටහන, ජනතා සහභාගීත්වයෙන් ජූලි 20 වන දින ආදිවිනායගර් කණ්ඩාවලෙ පාසලේදී පැවැත්විණි. එහිදී, ගොඩනැගිලි, උපකරණ සහ වහලවල් පිළිසකර කිරීමේ කටයුතු පිළිබඳ සාකච්ඡා විය.
- ජනතාව සවිබල ගැන්වීමේ වැඩසටහන් ඔක්තෝබර් 09 සහ 10 දිනවලදී කණ්ඩාවලෙ ධර්මපුර පේෂකර්මාන්ත පැවැත්වුණු අතර 86 දෙනෙක් ඊට සහභාගී විය.
- සමාජ ඒකාබද්ධතා නංවාලීමේ අවශ්‍යතාවය සොයා බැලීම සම්බන්ධව දිරිගැන්වීමේ රැස්වීමක් කරෙච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පවත්වන ලදී. එයට ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන් 60 දෙනෙකු සහභාගී විය.
- සමාජ ඒකාබද්ධතා නංවාලීමේ අවශ්‍යතාවය සොයා බැලීම සම්බන්ධව දිරිගැන්වීමේ රැස්වීමක් කණ්ඩාවලෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පවත්වන ලදී. එයට ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන් 35 දෙනෙකු සහභාගී විය.
- සමාජ ඒකාබද්ධතා නංවාලීමේ අවශ්‍යතාවය සොයා බැලීම සම්බන්ධව දිරිගැන්වීමේ රැස්වීමක් කරෙච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පවත්වන ලදි. එයට පවුල් 420 ක් සහභාගී විය.
- සමාජ ඒකාබද්ධතා අවශ්‍යතාවන් සම්බන්ධව පරීක්ෂාවන් කණ්ඩාවලෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේදී පවත්වන ලදි. එයට පවුල් 150 ක් සහභාගි වී අදහස් ලබාගන්නා ලදී.
- සමාජ ගැටළු හඳුනා ගැනීම සඳහා සමාජ ඒකාබද්ධතා සාකච්ඡාවන් කිළිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පැවැත්විණි. එයට 200 කට අධික පිරිසක් සහභාගී විය.
- කණ්ඩාවලෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශේෂ අවශ්‍යතා සහිත වුවන් සිටින පවුල් 08 කට පාපැදි ලබාදෙන ලදී.

05. නීතිය සමාන ලෙස ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම - අවසන් ජංගම සේවය

- අවසන් ජංගම සේවාවන් මාර්තු 24 හා 25 දින කරෙච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පැවැත්විණි. එයට 2500 දෙනෙකු සහභාගී විය.
- අවසන් ජංගම සේවාවන් මැයි 17 වන දින පච්චිලෙප්පල්ලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පැවැත්විණි. එයට 1700 දෙනෙකු සහභාගී විය.

06. සමාජය නංවාලීමේ වැඩසටහන් - ක්‍රීඩා හා සංස්කෘතික කටයුතු

- අප්‍රේල් මස උතුරු පළාත් ද්‍රවිඩ සිංහල අළුත් අවුරුදු උත්සවය 2012 දී පැවැත්විණ. එයට 800 කට අධික පිරිසක් සහභාගී විය.
- සැප්තැම්බර් 21 වන දින තරුන පරිවර්තන: ක්‍රීඩා හා සංස්කෘතික වැඩසටහන් පැවැත්විණ. එයට 500 කට අධික පිරිසක් සහභාගී විය.

07. භාෂා ප්‍රතිපත්තිය සහ මාධ්‍ය

- පාලම් ගුවන්විදුලි වැඩසටහනේදී භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධ වැඩසටහන් පැවැත්වීම පිළිබඳව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සියළු දෙපාර්තමේන්තු දැනුවත් කරන ලදී.
- සමාජ ඒකාබද්ධතාවය නංවාලීමට අධ්‍යාපනය , භෞතික සම්පත් ,ආර්ථිකය සහ ආරක්ෂාව ආදී බැනර් ප්‍රදර්ශනය කරන ලදී.

08. නීති සහායක වැඩසටහන්

- ජුලි මස සමාජ ඒකාබද්ධතා සතිය සඳහා නීති සහාය කඳවුර රාමනාදපුරම් ග්‍රාම නිලධාරි කොට්ඨාශයේදී පවත්වන ලදී .එයට 150 දෙනෙකු සහභාගී විය.
- ඔක්තෝබර් 19 වන දින නීති සහය කඳවුර පච්චිලෛප්පල්ලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේදී පවත්වන ලදී. එයට 75 දෙනෙකු සහභාගී විය.
- ඔක්තෝබර් 20 වැනි දින නීති සහය කඳවුර කරෙච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේදී පවත්වන ලදී. එයට 200 දෙනෙකු සහභාගී වූහ.
- ඔක්තෝබර් 21 වන දින නීති සහය කඳවුර කණ්ඩාවලෛ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේදී පවත්වන ලදී. එයට 150 දෙනෙකු සහභාගී වූහ.

**(ඌ) මැතිවරණ දෙපාර්තමේන්තුව**

2012 වසර සඳහා ඡන්දහිමි නාම ලේඛන සංශෝධනය 2012 ජුනි 01 වන දින සිට ආරම්භ කරන ලදී. සියළු ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරින් සඳහා සමාලෝචන රැස්වීම් පවත්වා අදාල ආකෘති පත්‍ර බෙදා දෙන ලදි. ඔක්තෝබර් මස අවසානයට පෙර සියළු දෙනාගේම ලියාපදිංචියන් ග්‍රාම නිලධාරීන් හරහා තහවුරු කරන ලෙස දැනුම් දෙන ලදී.

ඒ සඳහා සෑම ග්‍රාම නිලධාරී කාර්යාලයකදීම මහජනතා ප්‍රදර්ශනය සඳහා 2011 වසර සඳහා ලේඛනය ජුනි 01 වන දින සිට තබන ලදී. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර ඔක්තෝබර් මස ඒ ඒ ග්‍රාම

නිලධාරීවරුන් විසින් සෘජුව භාරදෙන ලදී. මෙම නැවත පරීක්ෂාවේදී ලැබුණු තොරතුරු මගින් කිළිනොච්චිය දිස්ත්‍රික් ලේඛන වලින් **2012** වසරට අදාළ පරිගණක ගත කරන ලද **'ඒ'** සටහන් සහ **"බී"** සටහන්වලද ලේඛනය සකස් කර මෙම ලේඛනය **2012.10.04** දින සිට **2012.10.31** දින දක්වා

මහජන ප්‍රදර්ශනය සඳහා පියවර ගෙන ඇත. මෙම කාලපරිච්ඡේදය තුළ ලැබෙන විරෝධතා, හිමිකම් ඉල්ලීම්, සංශෝධන සමඟ **2012** වසර ඡන්දහිමි නාම ලේඛන කටයුතු සියල්ල **2012** දෙසැම්බර් මාසයේදී අවසන් කරන ලදී.

**2012** වසර සඳහා නාම ලේඛන **2012.12.31** තහවුරු කරන ලදී. **2012** වසර අනුව මුළු ඡන්දහිමි සංඛ්‍යාව **68,589** ක් වේ. දීමනා සියල්ල යාපනය මැතිවරණ කාර්යාලය විසින් කරන ලදී. කිළිනොච්චි මැතිවරණ කාර්යාලය විසින් පිටපත් **157** ක් **2012** වසරේදි ලබා දෙන ලදී.

**2012** වසරේ ඡන්දහිමි තොරතුරු

| | |
|---|---|
| කරෙච්චි | **35,351** |
| කණ්ඩාවලෛ | **13,351** |
| පූනගර් | **12,310** |
| පච්චිලෛප්පල්ලි | **7,577** |
| | **68,589** |

**(එ) ජාතික හැඳුනුම්පත් ලබා දීම සම්බන්ධ කටයුතු**

කරෙච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව **2688** ක් වේ. ඉන් ලැබු හැඳුනුම්පත් සංඛ්‍යාව **1693**ක් වේ.

කණ්ඩාවලෛ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව **707** ක් වේ. ඉන් ලැබු හැඳුනුම්පත් සංඛ්‍යාව **638** ක් වේ.

පලෛ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව **434** ක් වේ. ඉන් ලැබු හැඳුනුම්පත් සංඛ්‍යාව **308** ක් වේ.

පූනගර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව **943** ක් වේ. ඉන් ලැබු හැඳුනුම්පත් සංඛ්‍යාව **177** ක් වේ.

(ඒ) දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

| අංකය | විස්තරය | සංඛ්‍යාව | මුද්දර වටිනාකම |
|---|---|---|---|
| 1 | වසරේ ලියාපදිංචි කරන ලද ඔප්පු | 2,440 | 6,288.00 |
| | වසරේ ලියාපදිංචි කරන ලද ප්‍රධානපත් | 91 | |
| 2 | වසරේ ලැබුනු ඔප්පු පිටපත් | 728 | |
| 3 | පිටපත් ලබා ගැනීම සඳහා ලැබුණු පිටපත් | | |
| | අ.ඉඩම් ලියාපදිංචි සහතික | 143 | 747.00 |
| | ආ. ඔප්පු පිටපත් | 19 | 4,925.00 |
| 4 | සෙවීමේ අයදුම්පත් - ඉඩම් ලේඛණ | 10 | 25.00 |
| 5 | පිටපත් සඳහා අලවන ලද මුද්දර ගාස්තු | | 4,362,614.60 |
| 6 | ලියාපදිංචි කරන ලද විවාහ | 1,134 | |
| 7 | ලියාපදිංචි කරන ලද උපත් | 2,719 | |
| 8 | ලියාපදිංචි කරන ලද මරණ | 318 | |
| 9 | අනුමත කරන ලද සංශෝධිත සහතික | 400 | |
| 10 | නිකුත් කරන ලද අනුමාන වයස සහතික | 51 | |
| 11 | ලියාපදිංචි කරන ලද කල් ගත වූ උපත් | 400 | |
| 12 | ලියාපදිංචි කරන ලද කල් ගත වූ මරණ | 28 | |
| 13 | විවාහ,උපත්,මරණ සහතික හා අනුමාන වයස සහතික පිටපත් ලබා ගැනීම සඳහා ලැබූ අයදුම්පත් | අ -20,991<br>ආ - 7,009 | 915,035.00<br>370,780.00 |
| 14 | ලබා දුන් පිටපත් | අ -23,468<br>ආ - 4,170 | |
| 15 | විවාහ,උපත්,මරණ,භාෂා පරිවර්තන අයදුම්පත් | 333 | 44,300.00 |
| 16 | ලබා දුන් භාෂා පරිවර්තිත පිටපත් | 443 | |

(ඔ) දිස්ත්‍රික් සංඛ්‍යා ලේඛන කටයුතු

ජන හා නිවාස සංගණනය - 2011 ගණන් ගැනීමේ කටයුතු 2012.02.27 දින සිට මාර්තු 21 වන දින දක්වා කිළිනොච්චිය දිස්ත්‍රික්කයේදී පැවැත්වුණි. 1981 සංගණනයෙන් වසර 30 ට පසු මෙවර මුළු රටම සංගණනයට ඇතුලත්විය. නිවාස සංඛ්‍යාව ගණන් ගැනීමේ සංගණනයේදී පුද්ගල තොරතුරු රැස් කිරීමට අතිරේකව නිවාස පහසුකම් තොරතුරු රැස් කිරීමද සිදු කරන ලදී. නිවාස පහසුකම් තොරතුරු රැස් කිරීම, පුද්ගලයින් ජීවත් වන නිවාස සංඛ්‍යාව පමණක් රැස් කිරීමට අතිරේකව දක්නට ලැබුණු නිවාසද එම ගණන් ගැනීමට ඇතුළත් විය. නිවාස තොරතුරු රැස් කිරීම, නිවාස තොරතුරු සහ මහජන තොරතුරු යන අංශ දෙක යටතේ සිදු කරන ලදී.

වසරේ සාමාන්‍ය වී අස්වැන්න ගණනය කිරීම සඳහා වසරට දෙවරක් පවත්වන ආදර්ශ ගණනය කිරීම්, කර්මාන්ත වල වාර්ෂික ගණනය, රැකියා ගණනය, මහජන අයවැය ගණනය, වී සංඛ්‍යා ලේඛන තොරතුරු රැස් කිරීම, උස් බිම් බෝග වගා තොරතුරු, පශු සම්පත් සංඛ්‍යා ලේඛන තොරතුරු, ගොඩනැගිලි සංඛ්‍යා ලේඛන තොරතුරු සහ නාගරික සිල්ලර මිල සහ අභ්‍යන්තර නිෂ්පාදන වල නිෂ්පාදකයින්ගේ මිලද සංඛ්‍යා ලේඛන ශාඛාව විසින් සිදු කරන ලදී.

## (ඕ) ආපදා කළමනාකරණ කටයුතු

**ආපදා පාලන කටයුතු**

කරෙරෙච්චි, කණ්ඩාවලෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි උරුත්තිරපුරම් ග්‍රාම නිලධාරී කොට්ඨාශයට කාණු පද්ධතිය **ප්‍රතිසංස්කරණය** කිරීමට මිලියන 6.3 ක්ද, පිරමන්දනාරු කාණු පද්ධති **ප්‍රතිසංස්කරණය** කිරීමට මිලියන 3.5 ක්ද ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ලබාදී ඊට අදාල පුනරුත්ථාපන කටයුතු අවසන් කර ඇත. ඒ අතර 2012 වසර සඳහා ආපදා පාලන කටයුතු සඳහා යෝජනා 12 ක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට ලබාදී ඇත.

ඔක්ස්ෆාම් ආයතනයේ ප්‍රතිපාදන මඟින් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ අංශය විසින් මිලියන 7 ක වටිනාකමකින් යුතු ආපදා පාලන කටයුතු පූනහරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සිදුකර ඇත.



**කාණු ප්‍රතිසංස්කරණය හා අබලන් ලිං අලුත්වැඩියා කිරීම.**

**ගංවතුර ආපදා කළමනාකරණ කාර්යාලය**

ඔක්තෝම්බර්, නොවැම්බර්, දෙසැම්බර් මාසවලදී ඇතිවුණු ආපදාවේදී කරෙරෙච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පවුල් **563** කට අයත් සාමාජිකයින් **2145** දෙනෙක්ද, කණ්ඩාවලෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පවුල් **3930** කට අයත් සාමාජිකයින් **14782** දෙනෙක්ද, පූනගරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පවුල් **322** කට අයත් සාමාජිකයින් **1228** දෙනෙක්ද, පලෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පවුල් **524** කට අයත් සාමාජිකයින් **1978** දෙනෙක්ද විපතට පත් වූහ**.** මොවුන්ගේ පවුල් **844** කට අයත් සාමාජිකයින් **3005** දෙනෙක් ආරක්ෂිත ස්ථාන **14**කට නතර කර, ඔවුන් සඳහා පිසූ ආහාර ලබාදෙන ලදී**.** විපතට පත් ජනතාව සඳහා සහනාධාර ආපදා සහන සේවා ආයතනය විසින්ද රාජ්‍ය නොවන සංවිධාන වලින්ද ලබාදෙන ලදී**.** විපතට පත් ජනතාවට පිසූ ආහාර ලබාදීමටද රුපියල් බිලියන **10** ක් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ලබාදෙන ලදී**.**



**ආරක්ෂිත ස්ථානවල රැඳී සිටින ජනතාව සඳහා සහනාධාර ලබාදීම සහ වෙනත් පහසුකම්**



ගංවතුරෙන් යටවූ කණ්ඩාවලෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



ඉරණමඩු වැව් බැම්මේ ඇතිවූ ජල කාන්දුවීමේදී ශ්‍රීලංකා රතු කුරුස සංගම් සාමාජිකයින් විසින් පස්කොට්ට දැමීම

**නියං සහනාධාර කටයුතු**

**2012** අප්‍රේල් මස සිට ඔක්තෝම්බර් මාසවලදී ඇතිවූ දැඩි නියඟය නිසා විපතට පත් කරෙච්චි, කණ්ඩාවලෙ, පූනහරි, පලෛ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පිහිටි ග්‍රාම නිළධාරී කොට්ඨාශවලට නියං කාලයේ පානීය ජලය ලබාදීමට රු.මිලියන **4**ක් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ලබාදෙන ලදී.

නියං කාලයේදී පානීය ජලය ලබාදීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හතරකට ලීටර් **1000** වතුරු ටැංකි **122**ක්ද, වතුර පොම්ප **14** ක්ද ආපදා සහන සේවා මධ්‍යස්ථානය මඟින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට ලබාදෙන ලදී. නියඟයෙන් විපතට පත් ග්‍රාම නිළධාරී කොට්ඨාශවලට පානීය ජලය ලබාදීම සඳහා උතුරු පළාත් ආණ්ඩුකාර ගරු චන්ද්‍රසිරි මැතිතුමා විසින් ලබාදුන් ට්‍රැක්ටර් වතුරු ටැංකි **4**ක්ද, දිස්ත්‍රික් ලේකම්තුමිය විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ **4**කට ලබාදෙන ලදී.

**ග්‍රාමීය මට්ටමේ ආපදා කළමනාකරණ කටයුතු**

ඔක්ස්ෆාම් ආයතනයේ අනුග්‍රහයෙන් එකෝ ආයතනයේ ප්‍රතිපාදන යටතේ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ අංශය මඟින් පූනහරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි ග්‍රාම නිළධාරී වසම් 19 කද, කණ්ඩාවලෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිළධාරී වසම් 6 කද ආපදා කළමනාකරණ කමිටු තෝරාගෙන ඔවුන් සඳහා ප්‍රථමාධාර, දැනුවත්කිරීම, ආපදා තත්ත්ව විශ්ලේෂණ, සන්නිවේදන සම්බන්ධව පුහුණු පාඨමාලා පවත්වන ලදී.

සුනාමි, ගංවතුර ආදීන් සඳහා පෙරහුරු වැඩසටහන් පූනහරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පල්ලිකුඩා, ඉරනෛමාදනගර්, නාච්චිකුඩා ආදී ග්‍රාම නිළධාරී කොට්ඨාශවලද, ගංවතුර ආපදා සම්බන්ධව පෙරහුරු වැඩසටහන් කණ්ඩාවලෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කෝරත්කන්කට්ටු ග්‍රාම නිලධාරී වසමේ පවත්වන ලදී.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන ආයතනයේ ප්‍රතිපාදන වලින්ද, ආපදා කළමනාකරණ අංශයේ අනුග්‍රහය ඇතිවද කරෙච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිළධාරී වසම් **6** කද, කණ්ඩාවලෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිළධාරී වසම් **6**කද, පච්චිලෛප්පල්ලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිළධාරී වසම් **3**කද ග්‍රාමීය මට්ටමේ ආපදා කළමනාකරණ කමිටුවද ඒ සඳහා

සිතියම් සකස් කරන ලදී. ඒ අතර ආරක්ෂිත ස්ථාන ලෙස තෝරාගත් පාසල් **15**කට සූර්යකෝෂ කට්ටලද, වැසිකිලි **37**ක්ද, ආහාර පිසීමේ උපකරණද ලබාදෙන ලදී.





**ආපදා කළමනාකරණ කටයුතු**

දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුද, ප්‍රාදේශීය මට්ටමේ ආපදා කළමනාකරණ කමිටුද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ **4**කින් තෝරාගන්නා ලදී.




| | |
|---|---|
| **කණ්ඩාවල ප්‍රාදේශීය ලේකම් කළමනාකරණ කමිටුව** | **පූනගරි ප්‍රාදේශීය ලේකම් කළමනාකරණ කමිටුව** |

දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුවල හැකියා වර්ධනය කිරීමේ වැඩමුළු දිස්ත්‍රික් ලේකම්තුමියගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීම. මෙම වැඩමුළුවලදී දිස්ත්‍රික් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ද, යුධහමුදා හා පොලිස් උසස් නිලධාරීන්ද සහභාගී විය.

**අනෙක් ආපදා කළමනාකරණ කටයුතු**

පූනහරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගිනි අනතුරු වලින් විපතට පත් සෙට්ටියාර් කුරිච්චි, පල්ලවරායන්කට්ටු, නල්ලූර් ග්‍රාම නිළධාරී වසමේද පච්චිලෛප්පල්ලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉයක්කච්චි ග්‍රාම නිලධාරී වසමේද විපතට පත් ජනතාවට ආපදා සහනසේවා මධ්‍යස්ථානය මඟින් සහනාධාර භාණ්ඩ ලබාදෙන ලදී. **2011/2012** වසරවලදී ගංවතුරෙන් විපතට පත් ජනතාවට සෙවිලි තහඩුද ආපදා කාලවලදී පිසූ ආහාර ලබාදීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ **4**කට, ප්‍රාදේශීය සභා **3**කටද පිසීමේ උපකරණද, ශබ්ද විකාශන යන්ත්‍රද ආපදා කළමනාකරණ අමාත්‍ය ගරු මහින්ද අමරවීර මැතිතුමා විසින් **2012/08/05** දින ලබාදෙන ලදී.



ආපදා කළමනාකරණ අමාත්‍ය ගරු මහින්ද අමරවීර මැතිතුමා විසින් **2012/08/05** දින සහනාධාර ලබාදීම



**2012/03/08** වන දින ජාත්‍යන්තර කාන්තා දිනය පල්ලිකුඩාහි පිහිටි සුන්නාවිල් පාසලේදී සමරන ලදී. එහිදී පාසල් ශිෂ්‍යයින් සඳහා චිත්‍ර තරඟයක්ද පවත්වා ජයග්‍රහණය ලැබූ සිසුන්ට තෑගි ලබාදෙන ලදී.



ජාතික ආරක්ෂක දිනය 2012 සැමරූ අවස්ථාවේදී



**2012/12/26** දින ජාතික ආරක්ෂක දිනය දිස්ත්‍රික් ලේකම්තුමියගේ ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී.
**651** වන හමුදා බල ඇණිය සමඟ ඒකාබද්ධව සුනාමි පෙරහුරු වැඩසටහන් මුළංකාවිල්, නාච්චිකුඩා, ඉරනෛමාදනගර් ග්‍රාම නිළධාරී වසමේද, **552** වන හමුදා බල ඇණිය සමග ඒකාබද්ධව කිලාලි ග්‍රාම නිළධාරී වසමේද පවත්වන ලදී.

වේල්ඩ් විෂන් රාජ්‍ය නොවන සංවිධානය සමග ඒකාබද්ධව පාසල් ආපදා කළමනාකරණ සම්මන්ත්‍රණ පවත්වන ලදී.



පාසල් ශිෂ්‍යයින් හා ගුරුවරුන් දැනුවත්කිරීම් වැඩමුළුව



## 5.2 සංස්කෘතික සහ ආගමික කටයුතු

### (අ) දිස්ත්‍රික් උපදේශන අංශය

පාසල් මට්ටමේ සිසුන් හා දෙමාපියන්ට සමාජ ගැටළු අඩුකිරීමේ අරමුණ ඇතිව පහත කරුණු සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී

- ළමා අපයෝජන වැලැක්වීම
- දෙමාපියන්ගේ හැකියාව
- ගැටවරවියේ ඇතිවන ගැටළු හා එය හැසිරවීම

මේ වගේම ග්‍රාමීය මට්ටමේද මානසික මාජ ප්‍රශ්න අඩුකිරීමේ අරමුණින් පහත කරුණු සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

- මානසික සමාජ ගැටළු සහ ඒවා වැලැක්වීම
- ළමුන්ට ඇතිවන ප්‍රචණ්ඩත්වය සහ දෙමාපියන් සම්බන්ධ හැකියාවන්
- මත්පැන් භාවිතය
- දෙමාපියන් සම්බන්ධ හැකියාවන් සහ නිවාස ප්‍රචණ්ඩත්වය
- සෞඛ්‍යමත් පවුල්

මේ අයුරින් උපදේශන ආශ්‍රිත විවිධ වැඩමුළු පවත්වන ලදී. මේවා ගුරුවරුන්, පෙර පාසැල් ගුරුවරුන්, ග්‍රාමීය මට්ටමේ ආයතන, කාන්තා සංවිධාන, ළමා නිවාස සේවකයන්, සමාජ සහය සේවකයන්, විශේෂ අවශ්‍යතා ඇති අය, තරුණ පවුල් ආදිය ඉලක්ක කරගෙන පවත්වන ලදී. එම වැඩමුළු වලට පහත කරුණු ඇතුලත් විය.

- ළමුන් සහ ඔවුන්ගේ සමාජ ගැටළු
- විවාහ උපදේශන
- විවාහයට පෙර උපදේශන
- ළමුන්ව අවබෝධ කර වැඩකිරීම
- සහාය දීමේ හැකියාව
- පීඩන හා එයට මුහුණ දීම

- දිස්ත්‍රික් මට්ටම

| මාසය | පුද්ගලික උපදේශන | පවුල් උපදේශන | වැඩමුළු | දැනුවත් කිරීමේ වැඩසටහන (පාසල් මට්ටමෙන්) | දැනුවත් කිරීමේ වැඩසටන් (ග්‍රාමීය මට්ටමෙන්) |
|---|---|---|---|---|---|
| | පුද්ගලයින් සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | වැඩසටහන් සංඛ්‍යාව | | |
| ජන | - | 02 | 01 | 01 | 01 |
| පෙබ | 03 | 01 | 01 | 01 | 03 |
| මාර්තු | 01 | - | - | - | - |
| අප්‍රේල් | 03 | 02 | - | 02 | |
| මැයි | 01 | 03 | 02 | 02 | 02 |
| ජුනි | 03 | 06 | 02 | 0 | - |
| ජූලි | 03 | 07 | 02 | 02 | 03 |
| අගෝ | 02 | 05 | 01 | - | - |
| සැප් | 02 | 01 | - | - | - |
| ඔක් | 03 | 06 | 03 | 01 | 02 |
| නොවැ | 01 | 03 | 01 | 01 | - |
| දෙසැ | - | 07 | 01 | - | - |
| එකතුව | 22 | 43 | 14 | 10 | 11 |

ප්‍රාදේශීය මට්ටම

| මාසය | පුද්ගලික උපදේශන | පවුල් උපදේශන | කණ්ඩායම් උපදේශන |
|---|---|---|---|
| ජන | 77 | 09 | 12 |
| පෙබ | 57 | 15 | 11 |
| මාර්තු | 50 | 04 | 06 |
| අප්‍රේල් | 87 | 21 | 03 |
| මැයි | 26 | 15 | 08 |
| ජූනි | 34 | 17 | 09 |
| ජූලි | 10 | 01 | 11 |
| අගෝ | 35 | 09 | 08 |
| සැප් | 31 | 11 | 08 |
| ඔක් | 55 | 09 | 07 |
| නොවැ | 26 | 06 | 04 |
| දෙසැ | 44 | 04 | 05 |
| එකතුව | 532 | 121 | 92 |





(ආ ) ජාතික ළමා රක්ෂණ අධිකාරිය

- කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පිහිටි ළමා නිවාස ( මහාදේව ළමා නිවාසය, කාන්ති ළමා නිවාසය, තිරුක්කුඩුම්බ කන්නියර් මඩම, කරුණා ආයතනය, අන්බහම් නිවාසය( මහජන සෞඛ්‍ය පරීක්ෂක, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ළමා පරිවාස නිළධාරී ,පොලිස් නිළධාරී, ජාතික ළමා රක්ෂණ අධිකාරිය නිලධාරීන් විසින් දෙවරක් අධීක්ෂණය කරන ලදී.
- සමාජ මට්ටමේ සංවිධාන වන කාන්තා සංගමය, ග්‍රාම සංවර්ධන සංගමය, ක්‍රීඩා සමිති, ග්‍රාමීය මට්ටමේ ළමා ආරක්ෂණ කමිටු සාමාජිකයින්ට පුහුණු සම්මන්ත්‍රණ **06**ක් පවත්වන ලදී.
- ළමුන් සම්බන්ධව රාජ්‍ය නිලධාරීන් සඳහා ළමා ආරක්ෂාව සම්බන්ධව පුහුණු සම්මන්ත්‍රණ **3** ක් පවත්වන ලදී.
- දිස්ත්‍රික් ලේකම්තුමියගේ ප්‍රධානත්වයෙන් ළමා සංවර්ධනය සම්බන්ධව දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටු සම්මන්ත්‍රණ **05** ක් පවත්වන ලදී.
- දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටු සාමාජිකයින් සඳහා පුහුණු වැඩමුළුවක් පවත්වන ලදී.
- ළමා අපයෝජනය සම්බන්ධව **1929** අංකයට ලැබු පැමිණිලි **17** අධීක්ෂණය කර ළමුන්ට විසඳුම් ලබා දෙන ලදී.
- පාසැල් සිසුන් සඳහා ළමා අයිතීන් හා ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ **10** ක් පවත්වන ලදි.
- ළමා ආරක්ෂාව සහ දෙමාපිය වගකීම් සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන් **17**ක් පවත්වන ලදී.
- පෙර පාසල් ගුරුවරුන් සඳහා හැකියාවන් වර්ධනය කිරීම සම්බන්ධව පුහුණු වැඩමුළු **3**ක් පවත්වන ලදී.
- ග්‍රාමීය මට්ටමේ කමිටු සාමාජිකයින්ට **1929** සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩමුළු **4**ක් පවත්වන ලදී.
- ළමා අයිතීන්, ළමා ආරක්ෂාව, ළමා නීති, **1929** දැනුවත් කිරීමේ අත්පත්‍රිකා **25000** ක් මුද්‍රණය කර නිකුත් කරන ලදී.
- ගර්භනී මව්වරුන් සහ පවුල් සෞඛ්‍ය සේවිකාවන් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ **05**ක් පවත්වන ලදී.
- ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය විසින් පිහිටුවන ලද ළමා සංගම් වලට ක්‍රීඩා උපකරණ කට්ටල (ක්‍රිකට්, පාපන්දු, දැල්පන්දු, පැසිපන්දු, කැරම් බෝඩ් බැඩ්මින්ටන් ) **15**ක් ලබා දෙන ලදී.
- ජාත්‍යන්තර ළමා කම්කරු දිනය දිස්ත්‍රික් මට්ටමෙන් පවත්වන ලදී.
- ජාත්‍යන්තර ළමා දිනය සහ ළමා පාගමන දිස්ත්‍රික් මට්ටමෙන් පවත්වන ලදී.
- ළමා නිවාස දරුවන් හා මානසික පීඩාවට පත් සිසුන්ට චතුර උපදේශන **07** ක් සිදුකරන ලදී.
- දිස්ත්‍රික් මට්ටමෙන් ළමා අයිතීන් සුරැකීම සම්බන්ධව අත් අකුරු වැඩසටහන් **05** ක් පවත්වන ලදී.
- දිස්ත්‍රික් මට්ටමෙන් ළමුන් සඳහා සංස්කෘතික වැඩසටහන් සහ ළමා කඳවුරක් පවත්වන ලදී.
- දිළිදු පවුල් වලට අයත් පාසල් සිසුන්ට අධ්‍යාපන උපකරණ **250** ක් ලබා දෙන ලදී.
- කිලිනොච්චිය දිස්ත්‍රික් මහ රෝහල, ජාතික ළමා ආරක්ෂණ අධිකාරි දිස්ත්‍රික් කාර්යාලයට ලැබුණු කායික හා මානසික වශයෙන් අපයෝජනයට ලක් වූ ළමුන් සම්බන්ධව පැමිණිලි **149** කි. **138** ට විසඳුම් ලබා දෙන ලදී.
- ළමා අපයෝජන සම්බන්ධව පැමිණිලි විභාග කිරීම සඳහා නිවාස 165 ක් පිළිබඳව පරීක්ෂණ පවත්වන ලදී.

**(ඉ) පුනරුත්ථාපන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් (පුද්ගලයින්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය)**

**1.** යුද්ධයෙන් විනාශ වූ නිවාස සඳහා සහනාධාර (මහජනතාවගේ)

**2.** රාජ්‍ය සේවක දේපල වන්දි

**3.** යුද්ධයෙන් විනාශ වූ ආගමික සිද්ධස්ථාන සඳහා දීමනා

**4.** යුද්ධයෙන් විනාශ වූ නිවාස අළුත්වැඩියා කටයුතු සඳහා ණය

**5.** යුද්ධයේදී මියගිය අය සඳහා වන්දි

**6.** යුද්ධයේදී තුවාල වූ අය සඳහා වන්දි

**7.** ස්වයං රැකියා ණය ලබාදීම

**8.** පුනරුත්ථාපනය කළ අය සඳහා ස්වයං රැකියා ණය ලබාදීම

**9.** විවාහ සඳහා දීමනා

**10.**වැන්දඹුවන් සඳහා ස්වයං රැකියා ණය ක්‍රමය

පුනරුත්ථාපන අධිකාරිය විසින් පුනරුත්ථාපනය කරන ලද අය සඳහා ස්වයං රැකියා ණය ලබාදීම. **2012** යවා තිබෙන අයදුම්පත්‍ර

| **ප්‍රා.ලේ. කොට්ඨාශය** | **සංඛ්‍යාව** |
|---|---|
| කරච්චි | **992** |
| කණ්ඩාවලෙ | **332** |
| පූනහරි | **254** |
| පච්චිලෙප්පල්ලි | **143** |
| **එකතුව** | **1721** |

ණය ලබාදීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා ණය ලබාගත් ප්‍රතිලාභීන්

| **ප්‍රා.ලේ. කොට්ඨාශය** | **සංඛ්‍යාව** |
|---|---|
| කරච්චි | **251** |
| කණ්ඩාවලෙ | **76** |
| පූනහරි | **59** |
| පච්චිලෙප්පල්ලි | **45** |
| **එකතුව** | **431** |

- අරලියගහ මන්දිරයේදී අතිගරු ජනාධිපතිතුමා විසින් **(30/07/2012)**
    - චෙක්පත්, බැංකු ලිපි ලබාදුන් අයගේ සංඛ්‍යාව - ප්‍රතිලාභීන් **235**

- යුද්ධයෙන් මියගිය තුවාල ලැබූ අය සඳහා වන්දි - ප්‍රතිලාභීන් **31**
    - රාජ්‍ය සේවකයින් සඳහා දේපල වන්දි - ප්‍රතිලාභීන් **15 (1,993,900.00)**
    - මහ ජනතාව සඳහා දේපල වන්දි - ප්‍රතිලාභීන් **04 (316,000.00)**

**(ඊ) ක්‍රීඩා ක්ෂේත්‍රය**

මුලතිව් දිස්ත්‍රික්කයේදී පැවති ගම හරහා දිවීමේ තරඟයේදී කිලිනොච්චිය දිස්ත්‍රික් තරඟකරුවන්ව කැඳවාගෙන ගොස් සහභාගී කරවිය. එහිදී අප දිස්ත්‍රික්කයේ සිටින තරඟකරුවකු වන වී.ලෝගනාදන් යන අය දෙවන ස්ථානය ලබමින් ජාතික ක්‍රීඩා තරඟයේදී උතුරු පළාත නියෝජනය කළේය.

පිරිමින් සඳහා වූ මිනි මැරතන් තරඟය කිලිනොච්චිය දිස්ත්‍රික් තරගකරුවන් අතර පවත්වන ලදී.ඒ සමඟ ප්‍රා.ලේ. කාර්යාල වල සේවය කරන නිලධාරීන් අතර කඹ ඇදීමේ තරඟයක් පවත්වන ලදී.

ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය ඒකාබද්ධව එල්ලේ තරඟ සමග දමිළ සිංහල අළුත් අවුරුදු ක්‍රීඩා උත්සවයක් පවත්වන ලදී. දමිළ සිංහල අළුත් අවුරුදු උත්සවයේදී ක්‍රීඩා අංග **18** ක් පවත්වන ලදී. ඒ සමඟ මෙම දිස්ත්‍රික් ප්‍රා.ලේ. කොට්ඨාශ අතර කණ්ඩායම් තරඟ පවත්වන ලදී. ඒ අතර එල්ලේ තරඟයට සහභාගී වී ජයග්‍රහණය ලැබූ කණ්ඩායම මොණරාගල දී පැවැත්වූ ජාතික එල්ලේ තරඟාවලියට කැඳවාගෙන ගොස් සහභාගී කරවිය. කිලිනොච්චිය දිස්ත්‍රික් ප්‍රා.ලේ. කොට්ඨාශ අතර කණ්ඩායම් තරඟ ද පවත්වන ලදී. ඒ සමඟ යූ.එන්.ඩී.පී. ආයතනයේ අනුග්‍රහයෙන් කිළිනොච්චිය දිස්ත්‍රික් තරුණ තරුණියන් සඳහා සවිබල ගැන්වීමේ සහ රැකියා මාර්ගෝපදේශ පුහුණු පාඨමාලා දින **2** ක් පවත්වන ලදී. ඒ සමඟ වවුනියාවේ දී පවත්වන ලද දිස්ත්‍රික්ක අතර තරඟයට තරගකරුවන් කැඳවාගෙන යන ලද'. ඒ අතර ප්‍රාදේශීය ක්‍රීඩා තරඟයේදී දක්ෂතා දැක්වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඟහා දින **3** ක කඳවුරු පුහුණුව කනකපුර ආර්.ඩී.එස්. ක්‍රීඩාංගණයේදී සංවිධානය කර පවත්වන ලදී.

උතුරු පළාත් දිස්ත්‍රික්ක අතර වවුනියාවේදී පවත්වන ලද බැට්මින්ටන්, මේස පන්දු, කබඩි ඇවිදීමේ තරග වලට අප දිස්ත්‍රික්කයේ තරගකරුවන් කැඳවාගෙන ගොස් සහභාගී කරවිය. එහිදී ඇවිදීමේ තරගයට සහභාගී වූ තරගකරුවකු තුන්වන ස්ථානය ලබාගත්තේය. යාපනයේදී පවත්වන ලද පළාත් කරාටේ, පැසිපන්දු, පාපන්දු, දැල්පන්දු තරග වලට අපේ දිස්ත්‍රික්කයේ තරගකරුවන් සහභාගී විය. ඒ සමග දිස්ත්‍රික් තරගය පවත්වන ලදී. මෙම තරගයේදී කරාටේ තරගයට සහභාගී වූ අපේ දිස්ත්‍රික් කණ්ඩායම් තරඟකරුවන්ගෙන් දෙදෙනෙක් දෙවන ස්ථානය හා තුන්වන ස්ථානය හිමිකර ගත්හ.

උතුරු පළාත් දිස්ත්‍රික් අතර පැවත්වූ ක්‍රීඩා උත්සව උතුරු ක්‍රීඩා දෙපාර්තමේන්තු සමඟ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සමඟ එකතු වී ඉතා උත්කර්ශවයෙන් පැවත්වුණි. මෙහිදී අපගේ කාන්තා තරඟකරුවන් උස පැනීම හා ජවලින් විසිකිරීමේ තරඟයේදී ප්‍රථම ස්ථානයද, කාන්තා තරඟකරුවන් තුන්දෙනෙක් හා පිරිමි තරඟකරුවන් දෙදෙනෙක් දෙවැනි ස්ථානයද, කාන්තා තරඟකරුවන් පස්දෙනෙක් හා පිරිමි තරඟකරුවන් තුන්දෙනෙක් තුන්වැනි ස්ථානයද ලැබූහ. මෙම තරඟයේදී **1,2,3** වැනි ස්ථාන ලැබූ තරඟකරුවන් උතුරු පළාත නියෝජනය කරමින් කොළඹදී පැවති ජාතික ක්‍රීඩා උළෙලට සහභාගීවීමට තෝරා ගැනීම ස`දහන් කලයුතු කරුණකි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ලියාපදිංචි ක්‍රීඩා සංගම් අතර අවු- **21** කට අඩු පාපන්දු තරඟ පැවැත්වීම.

අපගේ දිස්ත්‍රික්කයේ තිබෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලින් තෝරාගත් පිරිමි කණ්ඩායම් අතර පාපන්දු තරඟ පැවැත්වීම. ජාතික ක්‍රීඩා උළෙලේදී අප දිස්ත්‍රික් ක්‍රීඩකයන් සහභාගී කරවීම. ඒ සමගම යූ.එන්.ඩී.පී. ආයතනයේ අනුග්‍රහය මත පාපන්දු පුහුණු කඳවුර පැවැත්වීම. ජාතික පාපන්දු තරඟයට අවු **21** ට අඩු අපගේ තරඟකරුවන් සහභාගී කරවීම.

ජාතික ක්‍රීඩා උළෙලේදී අපගේ දිස්ත්‍රික් නියෝජනය කරමින් උතුරු පළාත් ක්‍රීඩා උළෙලේදී ජයග්‍රහණය ලැබූ තරඟකරුවන් සහභාගී කරවීම. යූ.එන්.ඩී.පී. ආයතනයේ අනුග්‍රහය මත පැසිපන්දු ක්‍රීඩිකාවන්ට දවස් තුනක් පුහුණු කඳවුරු පැවත්වීම.

## (උ) සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තු කාර්ය සාධන වාර්තාව

දැයට කිරුළ **20**12 ප්‍රදර්ශනය නිමිති කරගෙන පැවති කලා වැඩසටහනට කිලිනොච්චිය දිස්ත්‍රික් කලා වැඩසටහන් එළි දැක්වීම. ජාතික කලා සාහිත්‍ය තරඟ සඳහා අයදුම් කර ඇත.

බක්මහ උළෙල නිමිති කරගෙන ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය මගින් පවත්වන ලද අලුත් අවුරුදු දින උළෙලට කලා වැඩසටහන් ලබාදීම, රූපවාහිනී සංස්ථා අලුත් අවුරුදු සැමරුම් දින සඳහා කලා වැඩසටහන් ඉදිරිපත් කිරීම.

කිළිනොච්චි දිස්ත්‍රික්කයේ සේවය කරන රජයේ නිලධාරීන් අතර නිර්මාණශීලී කලා තරඟ සංවිධානය කර සම්මාන ලබාදීම.

ගරු උතුරු පළාත් ආණ්ඩුකාරතුමන්ගේ සම්මාන ලබාදුන් අතර කලා භූෂණ සම්මානද ලබාදෙන ලදී.

ගරු ආණ්ඩුකාරවරුන්ගේ **15** වන සම්මේලනයේදී කිළිනොච්චිය දිස්ත්‍රික් කලාකරුවන්ගේ කලා වැඩසටහන් ඉදිරිපත් කරන ලදී.

සරස්වතී පූජාව නිමිත්තෙන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේදී පැවති උත්සවයේදී මෙම දිස්ත්‍රික් කලා වැඩසටහන් ඉදිරිපත් කරන ලදී.

උතුරු පලාත් ද්‍රවිඩ සාහිත්‍ය උත්සවයේදී කලා වැඩසටහන් ඉදිරිපත් කිරීම, කිළිනොච්චිය දිස්ත්‍රික් සංස්කෘතික උත්සවය පැවැත්වීම සහ කලාකරුවන්ට ගෞරව දැක්වීම ආදී අංශ ආශ්‍රිතව කලාකරුවන් **12** දෙනෙකුට කිළිනොච්චිය කලා සම්මානය ලබාදීම.

කලාකරුවන්ගේ සුහද හමුව හා අවශ්‍යතා හඳුනාගැනීම පැවැත්වීම.

අතිගරු ජනාධිපතිතුමාගේ දෙවන පදවි ප්‍රාප්තිය නිමිති කරගෙන ආගමික කටයුතු සිදුකරනලදී.

**(ඖ) සමාජ සේවා**

1. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය **04** ඒකාබද්ධව ස්වේච්ඡා සේවකයන් විසින් සී.බී.ආර් වැඩසටහන සිදුකරන ලදී.
2. බී.එස්.එස්.ඕ., බී.ආර්.ඩී.ඕ. දිස්ත්‍රික් කාන්තා සංවර්ධන සංසදය ඒකාබද්ධව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ **2** කට ස්වයං රැකියා ආධාර ලබාදී ඇත. පරන්තන්, උමෛයාල්පුරම්හි කාර්යාල පිහිටුවා ඇත.
3. දිස්ත්‍රික් සමාජ සේවා කාර්යාලයේ මිලියන **3** ක පළමු අදියරෙහි වැඩ ඉටුකර ඇත.
4. ආබාධ සහිත පුද්ගලයන්ට සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් උපකරණ ලබාදී ඇත.
5. සී.බී.ආර් අභ්‍යාසලාභීන් සඳහා වැඩමුලුව හැන්ඩිකැප් ඉන්ටර්නැෂනල් ආයතනය විසින් පවත්වන ලදී.
6. කැරිටාස් හියුඩෙක් ආයතනය විසින් වට්ටක්කච්චි මායවනූර් ප්‍රදේශයේ ජනතාව සඳහා සමාජ දැනුවත්කිරීම් වැඩසටහන් පවත්වන ලදී.
7. ආබාධ සහිත පුද්ගලයන්ට චිත්‍ර තරඟ කලාප අධ්‍යාපන කාර්යාලය සමග ඒකාබද්ධව සිදුකරන ලදී.
8. වැඩිහිටි, ආබාධ සහිත පුද්ගලයන්ගේ දිනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ **4**ක පවත්වන ලදී.

**මහජන මාසික දීමනා (මාසික)**

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රතිපාදන | ප්‍රතිලාභීන් |
|---|---|---|
| කරෛච්චි | **11 60,000.00** | **3408** |
| පච්චිලෛප්පල්ලි | **30,000.00** | **762** |
| පූනගරි | **520,000.00** | **1774** |
| කණ්ඩාවලෛ | **660,000.00** | **2200** |
| එකතුව | **2 ,640,000.00** | **8807** |

වැන්දඹු, වැඩිහිටි, ආබාධ සහිත පුද්ගලයන්ගේ තොරතුරු

| අංකය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ආබාධ | වැඩිහිටි | වැන්දඹු |
|---|---|---|---|---|
| 01 | කරෙච්චි | **657** | **8438** | **5189** |
| 02 | පච්චිලෙප්පල්ලි | **194** | **523** | **947** |
| 03 | පූනහරි | **328** | **3205** | **2260** |
| 04 | කණ්ඩාවලෙ | **157** | **2545** | **2957** |
| | එකතුව | **1336** | **14711** | **11353** |

**රෝග සඳහා දීමනා (මාසික)**

| **ප්‍රාදේශීය ලේකම් කාර්යාලය** | **ප්‍රතිලාභීන්** | |
|---|---|---|
| | **පිලිකා රෝගීන්** | **ක්ෂය රෝගීන්** |
| කරෙච්චි | **73** | **18** |
| පච්චිලෙප්පල්ලි | **13** | **01** |
| පූනහරි | **11** | **02** |
| කණ්ඩාවලෙ | **32** | **01** |
| එකතුව | **129** | **22** |

**හදිසි අනතුරු සහනාධාර (නිවාස හානි) - 2012**

| **ප්‍රාදේශීය ලේකම් කාර්යාලය** | **ප්‍රතිලාභීන්** |
|---|---|
| කරෙච්චි | **34** |
| පච්චිලෙප්පල්ලි | **27** |
| පූනහරි | **34** |
| කණ්ඩාවලෙ | **34** |
| එකතුව | **129** |

**මහින්ද චින්තන මාසික දීමනා රු.3000**

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රතිලාභීන් |
|---|---|
| කරෙච්චි | **73** |
| පච්චිලෙප්පල්ලි | **13** |
| පූනහරි | **11** |
| කණ්ඩාවලෙ | **32** |
| එකතුව | **129** |

වැඩිහිටි පුරවැසියන් සඳහා සුභසාධන සේවා

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | හැඳුනුම්පත් | නිවාස | සමිති |
|---|---|---|---|
| කරෙච්චි | **1845** | **01** | **34** |
| පච්චිලෙප්පල්ලි | **437** | **-** | **12** |
| පූනහරි | **56** | **-** | **07** |
| කණ්ඩාවලෙ | **98** | **-** | **15** |
| එකතුව | **2436** | **01** | **68** |

ආබාධ සහිත පුද්ගලයන්ට සහන සැලසීම

| අංකය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | උපකරණ | ස්වයං රැකියා දීමනා |
|---|---|---|---|
| **01** | කරෙච්චි | **18** | **42** |
| **02** | පච්චිලෙප්පල්ලි | **05** | **-** |
| **03** | පූනහරි | **02** | **03** |
| **04** | කණ්ඩාවලෙ | **04** | **30** |
| | එකතුව | **29** | **75** |

යුනිසෙෆ් වැඩසටහන (ස්වයං රැකියා දීමනා රු **40,**000.00)

| **ප්‍රාදේශීය ලේකම් කාර්යාලය** | **ප්‍රතිලාභීන්** |
|---|---|
| කරෛච්චි | **-** |
| පච්චිලෛප්පල්ලි | **-** |
| පූනහරි | **51** |
| කණ්ඩාවලෛ | **07** |
| එකතුව | **58** |

වයස අවු: **70**ට වැඩි අය සඳහා රු**.1000.00** දීමනා

| **අංකය** | **ප්‍රාදේශීය ලේකම් කාර්යාලය** | **ප්‍රතිලාභීන්** |
|---|---|---|
| 01 | කරෛච්චි | 1044 |
| 02 | පච්චිලෛප්පල්ලි | 207 |
| 03 | පූනහරි | 296 |
| 04 | කණ්ඩාවලෛ | 452 |
| | එකතුව | 1999 |

## 5.3.සංවර්ධන කටයුතු

### (අ) දිස්ත්‍රික් සැලසුම් කාර්යාලය

කිළිනොච්චි දිස්ත්‍රික් සැලසුම් කාර්යාලය අප දිස්ත්‍රික්කයේ සංවර්ධනය දියත් කෙරෙන අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ කරෙච්චි, කණ්ඩාවලෙ, පූනහරි, පච්චිලෛප්පල්ලි ආදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල හතරද සමඟ ඒකාබද්ධව කටයුතු කෙරේ. මේ අයුරින් 2012 වසරේ පැවති ප්‍රධාන වැඩසටහන් ලෙස පහත කටයුතු සඳහන් කල හැකිය.

**1. දිවිනැගුම වැඩසටහන**

ශ්‍රී ලංකාවේ **2012** අයවැය පදනම් කරගෙන දිවිනැගුම ජාතික වැඩසටහන හරහා කෘෂිකර්මාන්තය, සත්ව පාලනය සහ ධීවර කර්මාන්තය වැනි ක්ෂේත්‍ර යටතේ දෛනික අවශ්‍යතාවයන් නිවාසවලදී ඉටුකරගැනීමටද, ස්වයං රැකියා සහ ගෘහ කර්මාන්ත කරගෙන යාම මගින් ගෘහ ඒකකයේ අතිරේක ආදායමක් ලබාගැනීමටද බලාපොරොත්තු වේ. ඒ අයුරින් ගෘහ ඒකක ලක්ෂ විසිපහක් සවිබල ගැන්වීම දිවිනැගුමේ ජාතික ඉලක්කය වේ. **2012** දී කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ දිවිනැගුම වැඩසටහන යටතේ පහත වැඩසටහන් සාර්ථක ලෙස ඉටුකරන ලදී.

**ගෙවතු සංවර්ධනය**

